# ගී සඳලුව

Gee... Sandaluwa

සිසිර දිසානායක



දුහුල් මලක - මල් පෙත්තක

මහින්ද බණ්ඩාර

ඒ ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රයේ කවුරුත් හොඳින් දන්නා නමක්. ඒත් ඒ ගීත රචනය නිසාවත්, ගායනය නිසාවත් නම් නෙවෙයි.

සංගීත් අධ්‍යක්ෂණයත් වාදනයත් නිසා.

අප බොහෝ දෙනෙක් දන්නේ ගීතයක් ගායනය කරන ගායන ශිල්පියාගේ නම විතරයි. ඒත් ඒ පසුබිමේ තවත් කීදෙනෙක් ඉන්නවාද ?

ගීත රචකයාට, සංගීත හා තනු නිර්මාණය කරන ශිල්පියාට අමතරව වාද්‍ය ශිල්පීන්, පටිගත කිරීමේ ශිල්පීන්......

ක්ෂේත්‍රයේ උදවිය මහින්දව අඳුනන්නේ ගිටාර් වාදන ශිල්පියෙක් විදියට. ඇත්තටම ඔහු ලංකාවේ ඉන්න දක්ෂතම ගිටාර් වාද්‍ය ශිල්පීන් දෙතුන් දෙනාගෙන් එක්කෙනෙක්ය කියලා කියලා කිව්වොත් නිවැරදියි. ලංකාවේදී වාගේම විදේශ රටවල පවත්වන අපේ සංගීත ප්‍රසංගවලදීත් මහින්ද නැතිවම බැරි චරිතයක්. ඒ නිසාම ඔහු ඕස්ට්‍රේලියාවටත් කීප සැරයක්ම ආවා.

නමුත් ගී සඳළුව වෙනුවෙන් අප මහින්ද බණ්ඩාරව දුරකථනයෙන් සම්බන්ධ කරගත්තේ ඔහු ජනප්‍රිය ගීත ගණනාවකම තනු හා සංගීත අධ්‍යක්ෂවරයා වුණා නිසා. ඒ ගීත ජනප්‍රිය වුණේ ඒ තනුවල හා සංගීතයේ තිබුණ මිහිරත්, නැවුම් බවත් නිසා. සාමාන්‍ය ජීවිතයේදීත් බොහොම සුහද සුන්දර පුද්ගලයෙක්, මහින්ද. ඔහුගේ ඒ සුහද සුන්දර බව නැවුම් බවකුත් අරගෙන ඒ නිර්මාණවලට කැටිවෙලා. නිරෝෂා විරාජිනී ගායන ශිල්පිනිය ගායනා කරන "දුහුළු මලක මල්පෙත්තක" ගීතය මහින්දගේ සංගීත නිර්මාණ අතරින් ඉහළටම ජනප්‍රිය වුණ ගීතයක්. ඉතින් අපි ඔහුට ඉඩ දෙමු ඒ ගැන කියන්න ගී සඳළුවට ගොඩවෙන්නට.

"නිරෝෂා මීට කලිනුත් මට කියලා තනු කරවාගෙන තිබුණා. "රන් ගිර මා" ගීතය කළාට පස්සෙයි කැළුම් ශ්‍රීමාල්ගේ "දුහුළු මලක මල්පෙත්තක" වචනයත් එක්ක මාව මුණගැහෙන්න ආවෙ." මහින්ද ගී සඳළුවට ගොඩවුනේ එහෙම.

නිරෝෂා ඒ වෙනකොටත් වෙනස් වෙනස් විදියේ ගීත කරලනෙ තිබුණෙ. එයාට හොඳ දක්ෂතාවයකුත් තියෙනවානේ ඕන රේන්ජ් : සෘහඪෑ* එකක කියන්න. ඉතින් අමුතුම දෙයක් කරලා බලන්න ඕන කියලා හිතුවා. වෙන සින්දුවක නැති දෙයක් කරන්න ඕන කියලා හිතුවා.

කැළුම් ගේ වචන ටිකෙත් අමුතුකමක් තිබුණා. නිරායාසයෙන් ගලාගෙන ආව වචන ඒ විදියටමයි කැළුම් ලියන්නෙ. මේ ගීතය ගත්තත් තියෙන්නේ හරිම ෆැන්ටසි ගතියක්නේ. ඇත්තට ම සම්භාව්‍ය ගණයේ වචන ටිකක් නොවුණත් ගලාගෙන යන විදියට ලියවුණු මේ වචන හරිම ලස්සනයි. මම නම් හිතන්නෙ තමන්ගේ හිතට එන නිර්මාණය නිර්ව්‍යාජ විදියට එළිදක්වන එකයි කලාව කියන්නෙ කියලා. ඒ මම කියන්නෙ නෑ සීමාව ඉක්මවලා යන එක හොඳයි කියලා. දැන් සින්දුවල නම් ඉතින් "පැණි කොමඩු ගෙඩිය, කැකිරි පළුව" වාගේ වචනත් තියෙනවානේ. ඒ වාගේ කිසිම ගීතවත්කමක් තියෙනවා ද ?" මහින්දගේ සිනාව දුරකථනයෙන් ඇහෙනකොට අපට දැකලා පුරුදු ඒ සිනාව හිතේ ඇඳුණා.

ඉතින් වචන ටික දැක්කම මට හිතුණා ස්පාඤ්ඤ ගීතයකට ළඟින් යන විදිහේ අපේ දෙයක් කරන්න. ස්වර නිතර ඉහළ පහළ යන විදියට තනුව කළේ මම දන්නවා නිරෝෂාට ඒ දේ හොඳට ගායනාකරන්න පුළුවන් බව. සින්දුව අහනකොට සිසිරට වුණත් තේරෙයි ඒ ස්වර ඉහළ පහළ යන විදිය. ඒ වගේම "කෝඩ්ස්" එහෙම නැත්නම් ස්වර සංගතිත් යොදාගත්තේ වෙන ගීතවලට නැති විදියකට.

මම "සෝලෝ" නැත්නම් ඒකල වයලින් වාද්‍ය බණ්ඩ යොදාගත්තා. ඒ වගේම එකෝඩියන් එක, බොක්ස් ගිටාර් එක වාගේ භාණ්ඩ යොදාගත්තා.

දුහුල් මලක මල් පෙත්තක
එහා මෙහෝ පෙනෙන පරිදි
සියුම් ව ලිව්වා වූ මගෙ පෙම් පණිවිඩය
සමනළයෙකු අතේ එව්වා - හම්බවුණා ද ?
බාර ගන්න පරිස්සමින් තටු පොඩි නොකර
මගෙ පෙම් පණිවිඩය
හම්බවුණාදැයි කියලා ලියල එවන්න
ඔබ වෙනුවෙන් තවදුරටත් ජීවත් වෙන්න....

ඔබට කැමති වූ දවසේ
දැණුන හැඟුමෙ පාට තමයි
දේදුන්නක් වෙලා දෑසට පාත් වුණේ
ඒ සතුටේ සුසුම තමයි
නළ මුදු සුවඳක් වී
ඇස තෙත මාත්තු කළේ
ඒ බව හැඟෙනවනම් මට - කියල එවන්න
ඒ ඇති මට ඔබ වෙනුවෙන් ජීවත් වෙන්න

ඔබ නික්මන් කළ දවසේ
උණපු කඳුලෙ තරම තමයි
පොද වැස්සක් වෙලා පොළවට පාත් වුණේ
ඒ කඳුලේ බලය තමයි
මහවැලි ගඟ මැද්දේ
දිය සුළියක් වූයේ
ඒ බව දැනෙනවනම් මට ලියල එවන්න
ඒ ටික ඇති තව දුරටත් ජීවත් වෙන්න

ප්‍රසංග වේදිකාවලට ගැලපෙන්නත් එක්ක "සික්ස් - එයිට් රිදම්" (Six - eight rythm) tකට තාලය යෙදුවා. අපේ අයට දැනෙන්නෙ ඉතින් "සික්ස් - එයිට්" නෙ... මහින්ද ආයෙමත් හිනාවුණා.

නිරෝෂාත් ගීතය උපරිමයෙන්ම හොඳට ගායනා කළා නියම ස්වර පරාසවල ඉඳගෙන හැම ස්වරයක්ම නිවැරදිව ගායනා කළා. කැළුම්ගේ වචනවලට තනුව, සංගීතය, ගායනය වගේම නිරෝෂාගේ කටහඬත් හොඳටම ගැලපුණා.

මේ හැම අංගයක්ම සමබරව ගැලපුණ නිසයි මේ ගීතය අදටත් මේ තරම් ජනප්‍රිය. ඒ වගේම ගීතයේ තියෙන නැවුම් බවත් ඒකට හරියට බලපෑවා..." මහින්ද ගී සඳළුවෙන් සමුගන්නට සූදානම් වුණා.

මහින්ද පාලිත විජේසුන්දර බණ්ඩාරගේ ගම කෑගල්ල. ප්‍රවීන් ගායන ශිල්පිනී ලතා වල්පොල මහත්මියගේ එකම දියණිය, ධම්මිකා වල්පොල යන ගායන ශිල්පිනිය මහින්දගේ ප්‍රිය බිරිඳයි. මෙල්බර්න් නුවර වසන වයලින වාද්‍ය ශිල්පී තිසර බණ්ඩාරත්, ගිටාර් වාද්‍ය ශිල්පී ගීතාන් බණ්ඩාරත් මහින්දගේ පුතුන් වන අතර දැනට ලංකාවේ වෙසෙන පියානෝ වාද්‍ය ශිල්පී මයුර බණ්ඩාර ඔහුගේ බාල පුතනුවන් වෙයි.

ඉතින් "ගී සඳළුව" පාඨකයින් වෙනුවෙන් ස්තූතිවන්ත වෙමින් අපි මහින්ද බණ්ඩාර ශිල්පියාණන්ට සමු දුන්නා.

## සියලුම ජෝතිශ්‍ය කටයුතු

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සීහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.......*

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.subodha-inc.com.au
0420682644/ 0433536097
subodha.inc@email.com

**Tripple Gem**
**Video & Audio Production**
Videography and Photography
Keep your memories forever
Weddings
Parties
Functions



Vijitha
Tel - 0412 083 876/ 94495635